රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 195

මගේ අංකය: 946එල්52බී.
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1981 ජූලි මස .10.. දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ රාජ්‍ය සංස්ථා හා
ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් වෙත.

රාජකාරි ගමන් සම්බන්ධයෙන් රජයේ සේවයේ ගෙවීම් ප්‍රමාණයන්,
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අදාළ කරවීම.

දිවයින තුළ රාජකාරි ගමන් සම්බන්ධයෙන් රජයේ සේවයේ ගෙවීම් ප්‍රමාණයන් රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ද අනුගමනය කළයුතු යයි රජය තීරණය කර තිබේ.

02. දිවයින තුළ රාජකාරි ගමන් සම්බන්ධයෙන් රජයේ නිලධරයනට දැනට ගෙවිය හැකි ගමන් වියදම් ප්‍රමාණයන්, ආයතන සංග්‍රහයේ XIV වන පරිච්ඡේදයේ සහ අංක 366 හා 1981 මැයි 29 වන දින දරන ආයතන චක්‍රලේඛ ලිපියේ විධිවිධානයන්ගෙන් පාලනය වෙයි.

03. ඉහත 02 වන ඡේදයේ සඳහන් ගෙවීම් ප්‍රමාණයන් 1981 අගෝස්තු 01 වන දින සිට බලපානසේ, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අදාළ කළයුතුය.

04. මෙම චක්‍රලේඛයේ කාර්යයන් සඳහා, රාජ්‍ය සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක සභාපතිවරයෙක් අමාත්‍යාංශ ලේකම්වරයෙකුට ද, විධායක අධ්‍යක්ෂවරයෙකු දෙපාර්තමේන්තු ප්‍රධානියෙකුට සමාන ලෙස සැලකිය යුතුය.

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්.

E/07-